සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපා
Department of Education, Southern Province Department of Educ

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## තෙවන වාර පරීක්ෂණය 2020
## Third Term Test 2020

| | | |
|---|---|---|
| II ශ්‍රේණිය<br>Grade 11 | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I, II | පැය තුනයි<br>Three hours |

## I පත්‍රය

**උපදෙස් :**
- **සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**
- **දී ඇති පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ' X' ලකුණ යොදන්න.**

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

උසස් අධ්‍යාපනය නිමකළ රවිඳු මාර්ගගත තාක්‍ෂණය (Online) ඔස්සේ අධ්‍යාපන වැඩසටහන් ඉදිරිපත් කරන ආයතනයක් ආරම්භ කළේය. රටේ පවත්නා වසංගත තත්ත්වය හමුවේ රවිඳුගේ මෙම වැඩසටහන් දරුවන් අතර බෙහෙවින් ජනප්‍රිය වී ඇත.

01. රවිඳු විසින් සපයන මූලික මිනිස් අවශ්‍යතාවය කුමක්ද?

1. සෞඛ්‍යය  2. අධ්‍යාපනය
3. ආරක්ෂාව  4. සන්නිවේදනය

02. රවිඳු සතු වෘත්තීය හා අධ්‍යාපනික නිපුණතා අයත් නිෂ්පාදන සාධකයක් වන්නේ,

1. භූමිය  2 ශ්‍රමය
3. ප්‍රාග්ධනය  4. ව්‍යවසායකත්වය

03. රවිඳු ව්‍යාපාරය,

1. හවුල් ව්‍යාපාරයකි.  2. කේවල ස්වාමී ව්‍යාපාරයකි.
3. සමාගමකි.  4. සමූපකාරයකි.

04. රවිඳුගේ ව්‍යාපරයට ඇති සිද්ධියේ සඳහන් ව්‍යාපාර අවස්ථාවක් වන්නේ,

1. මේ සඳහා දරුවන්ගේ ඇති ඉල්ලුමයි.
2. රවිඳු සතු විශේෂ කුසලතායි.
3. රටේ පවත්නා වසංගත තත්ත්වයයි.
4. රවිඳු සතුව ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීමයි.

05. මෙම සිද්ධියට අනුව දරුවන්ගේ,

1. අවශ්‍යතා විවිධය  2. අවශ්‍යතා සමානය
3. වුවමනා සමානය  4. වුවමනා සීමිතය

06. තනි පුද්ගල ව්‍යාපාරයකට විරුද්ධව නඩු පැවරීම කළ යුත්තේ,

1. අදාළ ව්‍යාපාරයේ හිමිකරුට විරුද්ධව වේ.
2. ව්‍යාපාර හිමිකරුට හා ව්‍යාපාරය යන දෙදෙනාටම විරුද්ධව වේ.
3. තනි පුද්ගල ව්‍යාපාරයකට විරුද්ධව නඩු පැවරිය නොහැකිය.
4. නියමිත ව්‍යාපාරයේ නමට විරුද්ධව වේ.

07. ව්‍යාපාර විසින් නිපදවන ඇතැම් භාණ්ඩ හා සේවා ඉතා ඉක්මනින් යල්පැනීමට භාජනය වේ. මේ සඳහා බලපානු ලබන පරිසර සාධකය කුමක්ද?

1. ආර්ථික පරිසරය
2. දේශපාලන පරිසරය
3. තාක්‍ෂණික පරිසරය
4. සමාජ හා සංස්කෘතික පරිසරය

08. අයිතිකරුගේ මූල්‍ය ශක්තිය, කුසලතා හා පළපුරුද්ද, ව්‍යාපාරය නිපදවන භාණ්ඩ හා සේවා ප්‍රමාණය, නිෂ්පාදනයට අදාළ වෙළෙඳපොළ කොටස යන සාධක අදාල වන්නේ,

1. හිමිකාරීත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේදීය.
2. අරමුණ අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේදීය.
3. පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේදීය.
4. සමාජ ශුභසාධනය පෙරදැරි කරගත් ව්‍යාපාරයක් ද යන්න තීරණය කිරීමේදීය.

09. ව්‍යාපාරයක අත්පිට විකුණුම් රු.85 000 කි. මෙම ගණුදෙනුවෙන් මූලික ගිණුම් සමීකරණයට වන බලපෑම වනුයේ,

1. වත්කම් වැඩි වේ. හිමිකම් වැඩි වේ.
2. වගකීම් වැඩි වේ. හිමිකම් අඩු වේ.
3. වත්කම් අඩු වේ. හිමිකම් අඩු වේ.
4. වගකීම් වැඩි වේ. වත්කම් අඩු වේ

10. වගකීම් හා වත්කම් යන දෙකම වැඩි වීමට අදාළ වන ගණුදෙනුව වන්නේ,

1. රක්‍ෂණ ගාස්තු ගෙවීම.
2. බැංකු ණය ලබා ගැනීම.
3. ණයහිමියන්ට මුදල් ගෙවීම.
4. ප්‍රාග්ධනය යෙදවීම.

11. ද්විත්ව සටහන් මූලධර්මයට අනුව "අඩු වීම හර වැඩි වීම බැර" ලෙස සටහන් කරන ගිණුම් වර්ගය උදෙසා උදාහරණයක් වන්නේ,

1. යන්ත්‍ර ගිණුම
2. විකුණුම් ගිණුම
3. මුදල් ගිණුම
4. වරිපනම් ගාස්තු ගෙවීම

12. ලෙජරයේ ඇති ණයහිමි ගිණුම .....①..... වන අතර දුන් වට්ටම් ගිණුම .....②..... වේ.

ඉහත අංක ① හා ② ස්ථානවලට අදාළ නිවැරදිතම යෙදුම් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. වත්කම් ගිණුමක්, ආදායම් ගිණුමක්
2. වගකීම් ගිණුමක්, වියදම් ගිණුමක්
3. වගකීම් ගිණුමක්, ආදයම් ගිණුමක්
4. වත්කම් ගිණුමක්, වියදම් ගිණුමක්

- පහත සඳහන් තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක 13 හා 14 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අරලිය පොත් ප්‍රකාශකයෝ ව්‍යාපාරයේ සිදු වූ ගණුදෙනු කිහිපයක් පහත දැක්වේ.

A - රු. 300 000 ක් වටිනා මුද්‍රණ යන්ත්‍රයක් ණයට ගැනීම.

B - රු. 300 000 ක් වටිනා මුද්‍රණ කඩදාසි අකිලගෙන් ණයට ගැනීම.

C - පියන්ත ලී බඩු සමාගමෙන් රු. 75 000 ක් වටිනා ලී බඩු උපකරණ ණයට ගැනීම.

D - පිරිවැය රු. 75 000 ක් වූ පොත් තොගයක් රු. 125 0000 කට ණයට විකිණීම.

13. ඉහත ගණුදෙනු වලින් ගැණුම් ජ'නලයේ සටහන් කරන ගණුදෙනු වන්නේ,

1. A ය.
2. B ය.
3. C ය.
4. D ය.

14. ඉහත ගණුදෙනුවලින් A, B හා D යන ගණුදෙනවලට අදාළ මූලාශ්‍ර ලේඛන පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. ජ'නල් වවුචරය, විකුණුම් ඉන්වොසිය හා ගැණුම් ඉන්වොයිසිය
2. ජ'නල් වවුචරය, ගැණුම් ඉන්වොසිය හා විකුණුම් ඉන්වොයිසිය
3. ගෙවීම් වවුචරය, ගැණුම් ඉන්වොසිය හා විකුණුම් ඉන්වොයිසිය
4. ගැණුම් ඉන්වොසිය, ජ'නල් වවුචරය හා විකුණුම් ඉන්වොයිසිය

- පහත තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක 15 හා 16 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

2020 ඔක්තෝබර් 31 දිනට සමීරගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය රු. 13 200 ක් විය. පහත හේතු නිසා එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය වෙනස් විය.

A - තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් රු. 7 000 කි.

B - බැංකුවට සෘජුවම ලැබී ඇති ණයගැති ප්‍රේෂණ රු. 3 000 කි.

C - ස්ථාවර නියෝග මත බැංකුව ගෙවා ඇති රක්ෂණ ගාස්තු රු. 2 500 කි.

15. ඉහත හේතු අතුරෙන් සමීරගේ බැංකු ගිණුමේ ශේෂය බැංකු ප්‍රකාශනයේ ශේෂයට වඩා වැඩිවීමට බලපාන හේතුව/ හේතු වන්නේ,

1. A පමණි
2. B පමණි
3. A හා C පමණි
4. B හා C පමණි

16. 2020 ඔක්තෝබර් 31 දිනට සංශෝධිත බැංකු ශේෂය,

1. රු. 6 700 කි.
2. රු. 15 100 කි.
3. රු. 13 700 කි.
4. රු. 16 200 කි.

- ඉඳුනිල් ව්‍යාපාරය රු. 30 000 ක් පිරිවැය වූ බඩු තොගයක් ණයට ගන්නා ලදි. එහිදී අඩුකළ වෙළෙඳ වට්ටම 10% කි. මුදල් ගෙවීමේදී 10% ක මුදල් වට්ටමක්ද හිමි විය.

17. ඉඳුනිල් ව්‍යාපාරයේ මුදල් ගෙවීම සම්බන්ධව නිවැරදි ද්විත්ව සටහන කුමක් ද?

1. ණයහිමි ගිණුම හර රු. 27 000
   මුදල් ගිණුම බැර රු. 27 000
2. ණයහිමි ගිණුම හර රු. 30 000
   මුදල් ගිණුම බැර රු. 30 000
3. ණයහිමි ගිණුම හර රු. 30 000
   මුදල් ගිණුම බැර රු. 3 000
   ලද වට්ටම් ගිණුම බැර රු. 3 000
4. ණයහිමි ගිණුම හර රු. 27 000
   මුදල් ගිණුම බැර රු. 24 300
   ලද වට්ටම් ගිණුම බැර රු. 2 700

- කුසල්ගේ ව්‍යාපාරයේ 2020.07.31 දින සුළු මුදල් භාරකරු ළඟ ඉතිරි මුදල රු. 2 000 කි. 2020 ජූලි මාසයේ සුළු මුදල් විශ්ලේෂණ තීරුවල ශේෂ පහත දැක්වේ.

| | |
|---|---|
| ලිපිද්‍රව්‍ය | රු. 3 000 |
| ගමන් ගාස්තු | රු. 1 800 |
| සංග්‍රහ වියදම් | රු. 2 000 |
| විවිධ වියදම් | රු. 1 200 |

කුසල් 2020.08.01 දින සිට සුළු මුදල් අග්‍රිමය වටිනාකම රු. 15 000 දක්වා වැඩි කිරීමට තීරණය කරන ලදි.

18. 2020.08.01 දිනට සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කලයුතු වටිනාකම වන්නේ,

1. රු. 2 000  2. රු. 8 000  3. රු. 13 000  4. රු. 15 000

19. සහන්ගේ ව්‍යාපාරයේ ජනවාරි මාසය සඳහා පිළියෙල කල ගැණුම් ජ'නලය පහත පරිදි වේ.

ගැණුම් ජ'නලය

| දිනය | ඉ/අ | සැපයුම්කරු | වටිනාකම | ලෙ.පි |
|---|---|---|---|---|
| 01/08 | 35 | බිමල් | 40 000 | |
| .....A..... | | ................B.................... | 40 000 | |


ඉහත ගැනුම් ජ'නලයේ A හා B යන ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. 01/10 ගැනුම් ගිණුමට හර කළා
2. 01/10 බිමල්ගේ ගිණුමට හර කළා
3. 01/31 බිමල්ගේ ගිණුමට හර කළා
4. 01/31 ගැනුම් ගිණුමට හර කළා

20. සිසිල්ගේ ව්‍යාපාරයේ 2020.03.31 දින පිළියෙල කළ ශේෂ පිරික්සුමේ හර තීරුවේ එකතුව රු.500 000 ක් වූ අතර බැර තීරුවේ එකතුව රු. 550 000 ක් විය. මෙම වෙනසට හේතු වූ ගිණුම්කරණයේදී සිදු වූ වරද වන්නේ,

1. දුන් වට්ටම් ගිණුමේ එකතුව රු. 50 000 කින් වැඩි වීමය.
2. විකුණුම් ගිණුමේ එකතුව රු. 50 000 කින් වැඩි වීමය.
3. ගැනුම් ගිණුමේ එකතුව රු. 50 000 කින් වැඩි වීමය.
4. ලද වට්ටම් ගිණුමේ එකතුව රු. 50 000 කින් අඩු වීමය.

21. සපුමල්ගේ නමට ලැබුණු රේඛිත චෙක්පත, ඔහු කළුතර මහජන බැංකුවේ ඇති තම ජංගම ගිණුමේ තැන්පත් කිරීමට ඉදිරිපත් කළ විට, එය එහි තැන්පත් කළ නොහැකි බව පවසා ඇත. මෙම චෙක්පතෙහි සඳහන් වූ රේඛනය කුමක්ද?




22. පහත සඳහන් ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශ දැක්වෙන අක්ෂර තෝරන්න.

A - ස්ථාවර තැන්පතු සහතිකය ඕනෑම අයෙකුට පැවරිය හැකිය.

B - ණයපතක් ලබා ගැනීම සඳහා ගණුදෙනුකරුට බැංකු ජංගම ගිණුමක් තිබීම අවශ්‍ය නොවේ.

C - රක්ෂණ ආවරණය ලබන පාර්ශවය රක්ෂිතයා නම් වේ.

D - සන්නිවේදන ක්‍රියාවලිය සම්පූර්ණ වීමට ප්‍රතිපෝෂණය අවශ්‍යම නැත.

1. A හා D  2. B හා C  3. A හා C  4. B හා D

23. පහත 'X' තීරුවේ ප්‍රවාහනය හා සම්බන්ධ සිදුවීම් කිහිපයක් ද 'Y' තීරුවේ ප්‍රවාහන මූලිකාංග ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. කොරෝනා වසංගතය හමුවේ 1990 ගිලන් රථ සේවාව ඇඟයීම. | A - මාර්ගය |
| 2. දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉතිරි වූ ඉදිකිරීම් කඩිනම් කිරීම. | B - මාධ්‍යය |
| 3. මාකුඹුර අධිවේගී බස් නැවතුම්පොළ නවීකරණය කිරීම. | C - බලය |
| 4. විවිධ ඉන්ධන ප්‍රභවයන් භාවිතය පිළිබඳ පර්යේෂණ කිරීම. | D - පර්යන්තය |

ඉහත 'X' තීරුවේ සඳහන් සිදුවීම් 'Y' තීරුවේ සඳහන් ප්‍රවාහන මූලිකාංග සමඟ පිළිවෙලින් ගලපන ලද පිළිතුර තෝරන්න.

1. A, B, D හා C  2. B, A, C හා D
3. B, A, D හා C  4. B, C, A හා D

24. පහත දැක්වෙන්නේ වෙළෙඳාමක් සිදු වූ අවස්ථා කිහිපයකි.

A - බේකරි හිමියෙකු වූ සරත් සිය බේකරි නිෂ්පාදන ආපනශාලාවලට විකිණීම.

B - දන්සලක් දීම සඳහා පියල් සහල් 200 Kg ක් මිලදී ගැනීම.

C - බතික් නිෂ්පාදකයෝ විසින් ලක්සලට බිත්ති සැරසිල්ලක් විකිණීම.

ඉහත වෙළෙඳාම් අතුරෙන් තොග වෙළෙඳාමට අයත් වනුයේ,

1. B හා C ය  2. A හා C  3. B හා C ය  4. A, B හා C යන සියල්ලමය

25. පහත ප්‍රකාශ අතුරෙන් මෙහෙයවීම හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. ව්‍යාපාරයක අරමුණු මුදුන් පමුණුවා ගැනීමට සංවිධානයේ කාර්යයන් බෙදීම, බලතල, වගකීම් හා රාජකාරී පවරාදීමේ ක්‍රියාවලියයි.
2. ව්‍යාපාරයක අරමුණු තීරණය කිරීම හා එම අරමුණු ඉටු කර ගැනීමේ ක්‍රම තීරණය කිරීමේ ක්‍රියාවලියයි.
3. සංවිධානයක තීරණය කරන ලද ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුවන්නේ ද යන්න සොයා බැලීම හා එසේ නොවන්නේ නම් ඊට අවශ්‍ය කටුයුතු සම්පාදනය කිරීමේ ක්‍රියාවලියයි.
4. සංවිධානයක අරමුණු මුදුන් පමුණුවා ගැනීමට කටයුතු කිරීමේ දී මානව සම්පත නිසි පරිදි යොමු කිරීම පිණිස බලපෑම් ඇති කිරීමේ ක්‍රියාවලියයි.

26. පසුගිය ලෝක ළමා දිනයේ දී "මල්ටි බුක්ෂොප්" ආයතනය වෙතින් මිලදී ගත් රු. 1000/= ට වැඩි සෑම බිල්පතක් සඳහාම කතන්දර පොතක් නොමිලයේ ලබාදෙන ලදි.
අලෙවිකරණ අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙහි භාවිතා කර ඇති අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් වන්නේ,

1. නිෂ්පාදිතය හා මිල
2. මිල හා ප්‍රවර්ධනය
3. ස්ථානය හා මිල
4. ප්‍රවර්ධනය හා නිෂ්පාදිතය

27. පහත සඳහන් ආයෝජන මාර්ග අතුරෙන් අවදානම අඩුම ආයෝජන මාර්ගය කුමක්ද?

1. දේපළ මිලට ගැනීම.
2. භාණ්ඩාගාර බිල්පත් ණයට ගැනීම.
3. කොටස් වෙළෙඳපොලේ ආයෝජනය.
4. ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීම.

28. සාමාන්‍ය කොටස් මිලදී ගැනීමෙන් ලැබෙන ප්‍රතිලාභයක් නොවන්නේ,

1. ලාභාංශ ආදායම් ය.
2. ප්‍රාග්ධන ලාභ ලැබීම ය.
3. පොළී ආදායම් ය.
4. ඡන්ද බලය හිමිවීම ය.

29. එක්සත් ක්‍රීඩා සමාජයට අදාළ පහත ගණුදෙනු අතුරෙන් ආදායම් ප්‍රකාශයේ ඇතුළත් නොවන ගණුදෙනුව කුමක්ද?

1. පරිත්‍යාග ලැබීම රු. 4 000
2. ක්‍රීඩා උපකරණ ගැනීම රු. 20 000
3. පුවත්පත් අලෙවියෙන් ලැබීම් රු. 2 000
4. ගොඩනැගිලි කුලී ගෙවීම රු. 10 000

30. පහත හිස්තැන සඳහා නිවැරදි පිළිතුර තෝරන්න.

| වර්ෂය තුළ ලැබූ සාමාජික මුදල් | + | වර්ෂය සඳහා හිඟ සාමාජික මුදල් | = | .............................. |
|---|---|---|---|---|

1. වර්ෂයේ අතිරික්තය
2. සමුච්චිත ක්ෂය
3. වාර්ෂික සාමාජික මුදල් ආදායම
4. සමාජිකයකුගේ වාර්ෂික සාමාජික මුදල

• පහත සඳහන් තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක 31 හා 32 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කසුන්ගේ ව්‍යාපාරය අල්මාරි නිෂ්පාදනය කර විකුණන ව්‍යාපාරයකි. එම ව්‍යාපාරය පසුගිය මාසයේ අල්මාරි 05 ක් සාදා ඇති අතර ඒ සඳහා වූ වියදම් දැක්වේ.

| | | | |
|---|---|---|---|
| ලී සඳහා | රු. 60 000 | වඩු කාර්මික වැටුප | රු. 24 000 |
| පොලිෂ්, ඇණ සඳහා | රු. 10 000 | විදුලි වියදම් | රු. 6 000 |

31. කසුන් ව්‍යාපාරයේ නිෂ්පාදන පොදු කාර්යය පිරිවැය වන්නේ,

1. රු. 84 000 2. රු. 40 000 3. රු. 34 000 4. රු. 16 000

32. කසුන් ව්‍යාපාරය අල්මාරියක් 20%ක ලාභාන්තිකයක් තබාගෙන විකිණීම සිදුකරයි නම් අල්මාරියක විකුණුම් මිල,

1. රු. 20 000 2. රු. 24 000 3. රු. 22 000 4. රු. 25 000

33. ව්‍යාපාරයක් 2018/01/01 දින රු. 250 000/= ක් වටිනා යන්ත්‍රයක් මිලට ගත් අතර එහි ඵලදායී ජීව කාලය අවුරුදු 05 කි. එම කාලය අවසානයේ යන්ත්‍රයේ සුන්බුන් අගය රු. 50 000/= කි. ව්‍යාපාරයේ 2019/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දැක්වෙන යන්ත්‍ර ක්ෂය වටිනාකම වන්නේ,

1. රු. 40 000 2. රු. 80 000 3. රු. 50 000 4. රු. 170 000

34. ශානකගේ ව්‍යාපාරය 2019/01/01 දින මාසික කුලිය රු. 10 000/= කට ගොඩනැගිල්ලක් කුලියට ලබා ගන්නා ලදි. 2019/12/31 දිනෙන් අවසන් වර්ෂය තුළදී රු. 90 000 ක් ගොඩනැගිලි කුලී ලෙස ගෙවා තිබුණි. මෙම ව්‍යාපාරයේ 2019/12/31 දිනට,

1. ගෙවූ ගොඩඩනැගිලි කුලී ගිණුමේ ශේෂය රු. 30 000 කි.
2. ගෙවූ ගොඩඩනැගිලි කුලී ගිණුමේ ශේෂය රු. 100 000 කි.
3. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන උපචිත ගොඩනැගිලි කුලී රු. 30 000 කි.
4. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන උපචිත ගොඩනැගිලි කුලී රු. 90 000 කි.

- පහත සඳහන් තොරතුරු උපයෝගී කර ගෙන ප්‍රශ්න අංක 35 සිට 40 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ජනිත්ගේ ව්‍යාපාරයේ 2019/12/31 දිනට ගිණුම් පොත්වලින් උපුටාගත් ශේෂ කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| තොගය (2019/01/01 දිනට) | 20 000 |
| විකුණුම් | 300 000 |
| ගැනුම් | 240 000 |
| ගෙන ඒමේ කුලී | 18 000 |
| ගොඩනැගිලි (පිරිවැයට) | 400 000 |
| 2019/01/01 දිනට ගොඩනැගිලි ක්ෂය වෙන් කිරීම් | 80 000 |
| කාර්යාල උපකරණ | 50 000 |
| ණයගැතියෝ | 20 000 |
| බැංකු අයිරාව | 28 000 |
| ණයහිමියෝ | 40 000 |
| විදුලි ගාස්තු | 10 000 |
| ගෙන යාමේ කුලී | 8 000 |
| මුදල් ශේෂය | 15 000 |
| දුන් වට්ටම් | 2 500 |

අතිරේක තොරතුරු :, (1) 2019/12/31 දිනට ඉතිරි තොගය රු. 30 000
(2) ගොඩනැගිලි වාර්ෂිකව 5% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.

35. ඉහත ව්‍යාපාරයේ 2019/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය වන්නේ,

1. රු. 248 000 2. රු. 278 000 3. රු. 300 000 4. රු. 258 000

36. මෙම ව්‍යාපාරයේ 2019/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය වන්නේ,

1. රු. 60 000 2. රු. 52 000 3. රු. 22 000 4. රු. 77 000

37. මෙම ව්‍යාපාරයේ දැකිය හැකි බෙදාහැරීමේ වියදමක් හා පරිපාලන වියදමක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. විදුලි ගාස්තු , ගෙනයාමේ කුලී 2. ගෙන යාමේ කුලී , දුන් වට්ටම්
3. ගෙන යාමේ කුලී , විදුලි වියදම් 4. විදුලි වියදම් , දුන් වට්ටම්

38. ඉහත ව්‍යාපාරයේ 2019/12/31 දිනට ගොඩනැගිලි වල ධාරණ අගය කොපමණද?

1. රු. 320 000 2. රු. 400 000 3. රු. 100 000 4. රු. 300 000

39. 2019/12/31 දිනට ජංගම වගකීම්වල වටිනාකම කොපමණද?

1. රු. 68 000 2. රු. 63 000 3. රු. 40 000 4. රු. 28 000

40. 2019/12/31 දිනට මෙම ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම් හා ජංගම වත්කම් වල වටිනාකම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. රු. 400 000 හා රු. 80 000 2. රු. 320 000 හා රු. 65 000
3. රු. 350 000 හා රු. 65 000 4. රු. 450 000 හා රු. 35 000

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපා
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Educ

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## තෙවන වාර පරීක්ෂණය 2020
## Third Term Test 2020

**11 ශ්‍රේණිය**
**Grade 11**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II**

## II පත්‍රය

**උපදෙස් :**

- **පළමුවන ප්‍රශ්නය අතුළුව I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් දෛනික රැකියා සඳහා යන පිරිසට ආරක්ෂිව තම සේවා ස්ථානය කරා යාම් ඊම් වර්තමානයේ පවතින දැඩි ගැටලුවක් වී ඇත. මේ බව අවබෝධ කරගත් සුපුන් සහ සුසර මාතර නගරයේ සිට ගාල්ල නගරය දක්වා රැකියා ස්ථාන කරායන 20 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමකට එක් අයෙකුගෙන් මසකට රු. 8 000 ක මුදලකට බස් රථයක් ධාවනය කිරීමේ ව්‍යාපාරයක් ''පුන්සර ටුවර්ස්'' නමින් 2020 මාර්තු 01 දින ආරම්භ කරන ලදි.

සුපුන් සහ සුසර රු. 200 000 බැගින් ව්‍යාපාරයට යෙදවන ලද අතර වාර්ෂික පොළී අනුපාතය 4% බැගින් රු. 600 000 ක බැංකු ණය මුදලක් ද ලබාගෙන කුඩා බස් රථයක් මිතුරෙකුගෙන් මිලදී ගන්නා ලදි.සතියේ රාජකාරී දින 05 තුළ දී යෑම් සහ ඒමේ සඳහා සේවය ලබාදෙන අතර සති අන්ත දින 02 බස් රථය වෙනත් චාරිකා සඳහා යොදවා ආදායම් ලබා ගනියි. බස් රථය තුල අනුගමනය කරන සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද, කාරුණික සේවය, නියමිත වේලාවට ධාවනය වැනි සාධක නිසා දැඩි ඉල්ලුමක් ඇත.

2020.03.31 දිනෙන් අවසන් මාසය තුළ සිදු වූ ගණුදෙනුවල සාරාංශයක් පහත දැක්වේ.

- බස් රථයෙන් ලැබීම් ,

| | |
|---|---|
| සේවාලාභී මගීන්ගෙන් | රු. 160 000 |
| චාරිකා වලින් | රු. 46 000 |

- ගෙවූ වියදම් ,

| | |
|---|---|
| ඉන්ධන සඳහා | රු. 40 000 |
| බස්රථය අලුත්වැඩියා වියදම් | රු. 10 000 |
| රියදුරු වැටුප් | රු. 40 000 |
| වෙනත් වියදම් | රු. 6 000 |

- 2020.03.31 දිනට පහත තොරතුරු සපයා ඇත.

(1) බස් රථය වාර්ෂිකව 12% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කෙරෙයි.

(2) බස්රථ අලුත්වැඩියා වියදම් රු. 2 000 ක් හා රියදුරු වැටුප් රු. 5 000 ක් ගෙවිය යුතුව ඇත.

2020.03.31 දින ව්‍යාපාරයේ මූල්‍ය ශක්තිය වර්ධනය කර ගැනීමේ අරමුණෙන් චාමර ද ව්‍යාපාරයට බඳවා ගැනීමට තීරණය කරන ලදි.

i. (අ) "පුන්සර ටුවර්ස්" ව්‍යාපාරය මගින් සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාව කුමක්ද?

(ආ) මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තියක් සඳහන් කරන්න.

ii. (අ) "පුන්සර ටුවර්ස්" කුමන ව්‍යාපාර සංවිධානයකට අයත් වේද?

(ආ) එම සංවිධාන ක්‍රමයේ දැකිය හැකි වාසි 02 ක් දක්වන්න.

iii. ප්‍රවාහන මූලිකාංග නම් කොට සිද්ධිය තුළින් නිදසුන් සොයා ඊට ඉදිරියෙන් ලියන්න.

iv. මෙම සිද්ධියේ සඳහන් වන සැලසුම්කරණ කාර්ය සඳහා නිදසුනක් සහ සංවිධානකරණ කාර්ය සඳහා නිදසුනක් බැගින් ලියන්න.

v. 2020 මාර්තු මාසයේ බස්රථ ක්ෂය ගිණුම්ගත කිරීමට අදාළ ජ'නල් සටහන ලියන්න.

vi. 2020 මාර්තු 31 දිනට "පුන්සර ටුවර්ස්" ආයතනයේ මුදල් ශේෂය ගණනය කරන්න.

vii. මෙම ව්‍යාපාරයේ 2020 මාර්තු 31 දිනට,

(අ) ජංගම වත්කමක් හා

(ආ) ජංගම වගකීමක් අගයන් සහිතව ලියන්න.

viii. 2020.03.31 දිනෙන් අවසන් මාසයේ "පුන්සර ටුවර්ස්" ව්‍යාපාරයේ ලාභය හෝ අලාභය ගණනය කරන්න.

ix. 20200.03.31 දිනට මෙම ව්‍යාපාරයේ මුළු හිමිකම කොපමණද?

x. 2020.03.31 දිනට මෙම ව්‍යාපාරයේ මුළු වගකීම් කොපමණද? **(ලකුණු 2x10=20)**

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

02. i. (අ) ව්‍යාපාරයක් යනු කුමක්ද?

(ආ) ව්‍යාපාර කටයුතු පිළිබඳ උනන්දුවක් දක්වන ඇල්මැති පාර්ශව 02 ක් ලියන්න. **(ලකුණු 02)**

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) මිනිස් අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ආකාර අවශ්‍යතා ලෙස හැඳින්වේ.

(ආ) ව්‍යාපාරයක බාහිර පරිසසරය අධ්‍යයනය කිරීම තුළින් එම ව්‍යාපාරයට ඇති අවස්ථා හා තර්ජන හඳුනාගත හැකිය.

(ඉ) අවසාන පරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගන්නා තැනැත්තා පාරිභෝගිකයා වේ.

(ඊ) සීමිත සමාගමක කොටස්කරුවන්ගේ වගකීම අසීමිත වේ. **(ලකුණු 02)**

iii. (අ) දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන වාසි 02 ක් දක්වන්න.

(ආ) පාරිභෝගිකයන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා රජය විසින් පිහිටුවා ඇති ආයතනය නම් කරන්න. **(ලකුණු 02)**

iv. (අ) රාජ්‍ය දෙපාර්තමේන්තු වල දක්නට ලැබෙන ලක්ෂණ 02 ක් දක්වන්න.

(ආ) කළමනාකරණය යන්නෙන් කුමක් අදහස් කරන්නේද? **(ලකුණු 02)**
**(මුළු ලකුණු 08)**

03. i. (අ) උපකාරක සේවා යනු කුමක්ද?

(ආ) තොග වෙළෙඳාමේ දක්නට ලැබෙන ලක්ෂණ 02 ක් දක්වන්න. **(ලකුණු 02)**

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ශ්‍රී ලංකාවේ නිපදවන අත්වැසුම් හා මුව ආවරණ විදේශීය රටවලට අලෙවි කිරීම අපනයන වෙළෙඳාම වේ.

(ආ) චෙක්පතක අණලදු සෑම විටම වාණිජ බැංකුවකි.

(ඉ) රක්ෂණ ඔප්පුවක් ලබා ගැනීමේ දී රක්ෂිතයා හා රක්ෂකයා රක්ෂණ ගිවිසුමට අදාළ තොරතුරු සියල්ලම හෙළි කල යුතු නොවේ.

(ඊ) සන්නිවේදන ක්‍රියාවලියට සම්පූර්ණවීමට ප්‍රතිපෝෂණය අවශ්‍ය වේ. **(ලකුණු 02)**

iii. (අ) "චෙක්පතක් පිටසන් කිරීම" යන්න පැහැදිලි කරන්න.

(ආ) සුදුසු ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සලකා බලන සාධක 02 ක් සඳහන් කරන්න. **(ලකුණු 02)**

iv. (අ) ප්‍රනාන්දු සිය මෝටර් රථය රු. 30 000.00 කට රක්ෂණය කර ඇත. සිදු වූ අනතුරකින් රථයට රු. 20 000.00 ක අලාභයක සිදු වූ විට ඔහුට ලැබෙන වන්දි මුදල කොපමණද?

(ආ) විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවාවේ දක්නට ලැබෙන සීමාවන් 02 ක් දක්වන්න. **(ලකුණු 02)**

**(මුළු ලකුණු 08)**

04. i. (අ) භාණ්ඩාගාර බිල්පතක් යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ආ) ආයෝජකයෙකුහට සාමාන්‍ය කොටස් හි ධනය ආයෝජනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ 02 ක් සඳහන් කරන්න. **(ලකුණු 02)**

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ආයෝජනයක අවදානම ඉහළ යන විට ඉන් ලැබෙන ප්‍රතිලාභය ඉහළ යයි.

(ආ) සැලසුම් කරන ලද ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ දී ව්‍යාපාරයේ මානව සම්පත් නිසිලෙස හැසිරවීමේ ක්‍රියාවලිය පාලනය නමින් හඳුන්වයි.

(ඉ) ව්‍යාපාරයකට වඩාත් ආකර්ශනීය ලෙස මෙන්ම ලාභදායී ලෙස තෘප්තිමත් කළ හැකි පාරිභෝගික කොටස ඉලක්ක වෙළෙඳපොළ වේ.

(ඊ) ව්‍යාපාරයේ සම්පත් අපේක්ෂිත අයුරින් ඉටුකර ගැනීම කාර්යක්ෂමතාවය වේ. **(ලකුණු 02)**

iii. හර්ෂා තම ප්‍රදේශයේ රූපලාවන්‍යාගාරයක් පවත්වා ගෙන යයි. ඇයගේ පාසලේ යෙහෙලියන් තිදෙනෙකු ද සේවය කරයි. රූපලාවන්‍යාගාරය වායු සමනය (AC) කිරීමට ඇය අදහස් කරගෙන සිටියි.

(අ) මෙම ව්‍යාපාරයේ කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතා 02 ක් සඳහන් කරන්න.

(ආ) මෙම ව්‍යාපාරයේ දැනට සේවය කරන ශ්වේතා හවුල්කාරිනියක් ලෙස ව්‍යාපාරයට සම්බන්ධ වීමට අදහස් කර ඇත. එහි දී රු. 850 000 ක ණය මුදලක් ද යෙදවීමට ඇය තීරණය කර ඇත. මේ නිසා ව්‍යාපාරයට අත්වන නව මූල්‍ය සම්පාදන මාර්ග 02 ක් දක්වන්න. **(ලකුණු 02)**

iv. (අ) ඩෙස්මන් පිළිගත් ව්‍යාපාරයක අලෙවි කළමනාකරුවෙකු ලෙස සේවය කරයි. ඔහු විසින් ඉටුකරන ලද කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

A - නිෂ්පාදිතයන් බෙදාහැරීම සඳහා ශීතාගාර පහසුකම් ඇති වෑන් රථයක් මිලදී ගැනීම.

B - දැනට නිපදවන නිපයුම් වල හැඩය හා සංයෝග වල වෙනස්කම් කිරීමට තීරණය කිරීම.

C - පාරිභෝගිකයන් සමඟ ආකර්ශනීය ලෙස සබඳතා පවත්වා ගැනීමට විකුණුම් සේවකයන්ට උපදෙස් දීම.

D - ණය කොන්දේසි හා ගෙවීම් ක්‍රම සරල කොට ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂා කල විකුණුම් ආදායම් උපයා ඇත්දැයි සොයා බැලීම.

ඉහත එක් එක් කාර්යය අලෙවිකරණ මිශ්‍රයේ කුමන විචල්‍යයට අයත් ද යන්න සඳහන් කරන්න.

(ආ) ව්‍යාපාරයකට අලෙවිකරණය වැදගත් වීමට හේතුවන කරුණු 02 ක් සඳහන් කරන්න.

**(ලකුණු 02)**

**(මුළු ලකුණු 08)**

## II කොටස - ගිණුම්කරණය

05. i. (අ) වගකීමක් යනු කුමක්ද?

(ආ) වත්කම් ගිණුම්වලට අදාළ ද්විත්ව සටහන් මූලධර්ම ලියන්න. **(ලකුණු 02)**

ii. පහත ගණුදෙනුවලට අදාළ ද්විත්ව සටහන් ලියන්න.

(අ) ණයහිමි කසුන්ට රු. 8 000/= ක් චෙක් පතකින් ගෙවීම.

(ආ) අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනය සඳහා මුදලින් රු. 5 000/= ක් ගැනීම. **(ලකුණු 02)**

iii. චාමික ජංගම දුරකථන සහ උපාංග අලෙවි කිරීමේ ව්‍යාපාරයක් 2020/01/01 දින ආරම්භ කරන ලදි. සිදු වූ ගණුදෙනු කිහිපයක් පහත දැක්වේ.

1. චාමික ව්‍යාපාරයට මුදල් යෙදවීම රු. 200 000
2. බැංකු ණයක් ලබා ගැනීම රු. 100 000
3. කාර්යාල උපකරණ මිලදී ගැනීම රු. 60 000
4. ගොඩනැගිල්ලට මාසික කුලිය ගෙවීම රු. 10 000
5. රු. 150 000 ක් වටිනා ජංගම දුරකථන ණයට ගැනීම

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත එක් එක් ගණුදෙනුව ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න. (පිළිතුරු සැපයීමේ දී පහත ආකාරයේ ආකෘතියක් භාවිතා කරන්න. පළමු ගණුදෙනුව සටහන් කර ඇත.)

| ගණුදෙනුව | වත්කම් (රු.) = | හිමිකම් (රු.) + | වගකීම් (රු.) |
|---|---|---|---|
| 1. | + 200 000 (මුදල්) | + 200 000 (ප්‍රාග්ධනය) | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

(ආ) 2020/01/01 දිනට චාමිකගේ ව්‍යාපාරයේ පහත සඳහන් අයිතම වල වටිනාකම දක්වන්න.

1. ජංගම නොවන වත්කම්    2. ජංගම වත්කම්

3. හිමිකම්    4. මුළු වගකීම්    **(ලකුණු 04)**

iv. චතුරගේ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසයේ සිදු වූ ගණුදෙනු කිහිපයක් පහත දැක්වේ.

2020/01/10 - එකක් රු. 400 බැගින් තේ කොළ පැකට් 10 ක් නිශාන්ගෙන් ණයට ගැනීම. (ඉන්වොයිසි අංක 510)
2020/01/15 - එකක් රු. 85 බැගින් සීනි පැකට් 100 ක් අත්පිට මුදලට ගැනීම. (ලදුපත් අංක 55)
2020/01/18 - එකක් රු. 60 බැගින් සබන් කුඩු පැකට් 100 ක් අසංකගෙන් ණයට ගැනීම. (ඉන්වොයිසි අංක 420)
2020/01/25 - පසිඳු ලී බඩු වෙතින් රු. 30 000 ක් වටිනා කාර්යාල මේසයක් ණයට ගැනීම.

අවශ්‍ය වන්නේ,

(අ) 2020 ජනවාරි මාසය සඳහා චතුර ව්‍යාපාරයේ ගැනුම් ජ'නලය පිළියෙල කිරීම.

(ආ) 2020/01/31 දිනට ගැනුම් ජ'නලයේ තොරතුරු ලෙජර් ගිණුම්වලට පිටපත් කිරීම

**(ලකුණු 04)**
**(මුළු ලකුණු 12)**

06. i. (අ) බැංකු අයිරාවක් යනු කුමක්ද?

(ආ) ගිණුම්කරණයේදී වැරදි සිදුවන අවස්ථා 02 ක් ලියන්න. **(ලකුණු 02)**

ii. මල්පෝච්චි නිෂ්පාදනය කරන "ධරණී" ව්‍යාපාරයේ 2020 මාර්තු මාසයට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

- මල් පෝච්චියක පිරිවැය රු. 40
- නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය රු. 30 000
- මුලු නිෂ්පාදන පිරිවැය රු. 80 000
- ඍජු ශ්‍රම පිරිවැය රු. 12 000
- ඍජු වෙනත් වියදම් රු. 8 000

අවශ්‍ය වන්නේ,

(අ) මාර්තු මාසය තුළ නිපද වූ මල් පෝච්චි ගණන

(ආ) මාර්තු මාසය සඳහා ඍජු ද්‍රව්‍ය පිරිවැය **(ලකුණු 02)**

iii. සහන්ගේ ව්‍යාපාරයේ 2020/06/30 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 28 000 ක් විය. නමුත් 2020 ජුනි මාසය සඳහා බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශයේ ශේෂය ඊට වෙනස් විය. වෙනසට හේතු ලෙස පහත කරුණු අනාවරණය කර ගන්නා ලදි.

- බැංකු ගිණුමේ සටහන් නොවූ සෘජු ප්‍රේෂණ රු. 3 000
- තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් රු. 4 000
- නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් වල වටිනාකම රු. 3 800
- බැංකුව කරන ලද ස්ථාවර නියෝග අනුව ගෙවීම් රු. 2 500

අවශ්‍ය වන්නේ,

(අ) 2020/06/30 දිනට බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම.

(ආ) 2020/06/30 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම **(ලකුණු 04)**

iv. පහත දැක්වෙන්නේ ගිණුම්කරණයේදී සිදු වූ වැරදි කිහිපයකි.

A - රු. 5 000 ක විකුණුම් ඉන්වොයිසියක් ගිණුම් පොත්වලින් සම්පූර්ණයෙන් මඟ හැරීම.

B - ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා මිලටගත් රු. 20 000 ක් වූ කාර්යාල උපකරණ වල වටිනාකම ගැනුම් ගිණුමට හර කර තිබීම.

C - ණයගැතියකුගෙන් ලැබුණු රු. 8 000 මුදල් පොතේ පමණක් සටහන් කිරීම.

D - විකුණුම් ජ'නලයේ නිවැරදි එකතුව වූ රු. 35 000 ක් විකුණුම් ගිණුමේ රු. 5 000 ක් ලෙස සටහන් කිරීම.

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන් **(ලකුණු 04)**

**(මුළු ලකුණු 12)**

07. i. (අ) ඒක පුද්ගල ව්‍යාපාරයක පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශන මොනවාද?

(ආ) බොල් ණය ගිණුම්ගත කිරීමට අදාළ ද්විත්ව සටහන ලියන්න. **(ලකුණු 02)**

ii. රන්තරු ක්‍රීඩා සමාජයේ 2019 වර්ෂයේ සිටි සාමාජික සංඛ්‍යාව 100 කි. එක් අයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 150 කි.
2019 වර්ෂය සඳහා පිළියෙල කළ ලැබීම් හා ගෙවීම් ගිණුම පහත දැක්වේ.

ලැබීම් හා ගෙවීම් ගිණුම

| | | | |
|---|---|---|---|
| 19/01/01 ශේෂය | 18 000 | ක්‍රීඩා උපකරණ වියදම් | 9 000 |
| සාමාජික මුදල් | 10 000 | ක්‍රීඩා උපදේශක ගාස්තු | 6 000 |
| | | ක්‍රීඩාගාර නඩත්තු වියදම් | 3 000 |
| | | විදුලි ගාස්තු | 2 000 |
| | | 19/12/31 ශේෂය ප/ගෙ | 8 000 |
| | 28 000 | | 28 000 |
| ශේෂය ඉ/ගෙ | 8 000 | | |

අවශ්‍ය වන්නේ,

(අ) 2019/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රන්තරු ක්‍රීඩා සමාජයේ ආදායම් ප්‍රකාශනය පිළියෙල කරන්න. **(ලකුණු 02)**

iii. හංසනීගේ ව්‍යාපරයේ 2019/12/31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| ගිණුමේ නම | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැය) | 500 000 | |
| ප්‍රාග්ධනය | | 600 000 |
| යන්ත්‍ර - පිරිවැයට | 150 000 | |
| යන්ත්‍ර ක්ෂය වෙන් කිරීම් (2019/01/01 දිනට) | | 15 000 |
| තොගය (2019/01//01) | 25 000 | |
| ගැනුම් | 250 000 | |
| විකුණුම් | | 340 000 |
| වේතන | 10 000 | |
| ණයගැතියෝ | 20 000 | |
| ණයහිමියෝ | | 25 000 |
| ලද වට්ටම් | | 5 000 |
| දුන් වට්ටම් | 2 000 | |
| ප්‍රචාරණ ගාස්තු | 6 000 | |
| විදුලි ගාස්තු | 2 800 | |
| වරිපනම් | 1 200 | |
| මුදල් ශේෂය | 8 000 | |
| බැංකු ශේෂය | 10 000 | |
| | 985 000 | 985 000 |

අතිරේක තොරතුරු , 1. 2019/12/31 දිනට තොගය රු. 18 000

2. යන්ත්‍ර සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 10% බැගින් ක්ෂය කළ යුතුය.

3. 2019/12/31 දිනට ගෙවිය යුතු විදුලි ගාස්තු රු. 1 000

අවශ්‍ය වන්නේ,

(අ) 2019/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය **(ලකුණු 04)**

(ආ) 2019/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය **(ලකුණු 04)**

**(මුළු ලකුණු 12)**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Department of Education, Southern Province Department of Educ

# තෙවන වාර පරීක්ෂණය 2020
# Third Term Test 2020

11 ශ්‍රේණිය
Grade 11

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II

## පිළිතුරු පත්‍රය
### I - පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | **2** | 11 | **2** | 21 | **4** | 31 | **4** |
| 02 | **4** | 12 | **2** | 22 | **2** | 32 | **2** |
| 03 | **2** | 13 | **2** | 23 | **3** | 33 | **1** |
| 04 | **3** | 14 | **2** | 24 | **2** | 34 | **3** |
| 05 | **2** | 15 | **3** | 25 | **4** | 35 | **1** |
| 06 | **1** | 16 | **3** | 26 | **2** | 36 | **2** |
| 07 | **3** | 17 | **4** | 27 | **2** | 37 | **3** |
| 08 | **3** | 18 | **3** | 28 | **3** | 38 | **4** |
| 09 | **1** | 19 | **4** | 29 | **2** | 39 | **4** |
| 10 | **2** | 20 | **2** | 30 | **3** | 40 | **3** |

**(ලකුණු 1x40=40)**

### II - පත්‍රය

i. (අ) ප්‍රවාහනය

(ආ)
- මූල්‍ය ශක්තිය
- කාලීන ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීමේ හැකියාව
- සුවිශේෂී වූ ගුණාත්මක සේවය **(ලකුණු 02)**

ii. (අ) හවුල් ව්‍යාපාර/ පෞද්ගලික අංශයේ ව්‍යාපාර/ ලාභ අරමුණු කරගත් ව්‍යාපාර/ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

(ආ)
1. පහසුවෙන් ආරම්භ කළ හැකි වීම.
2. වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකි වීම.
3. හවුල්කරුවන් සතු විවිධ දක්ෂතා ප්‍රයෝජනයට ගත හැකි වීම.
4. වගකීම හවුල්කරුවන් අතර බෙදී යාම.
5. සාමූහික තීරණ ගත හැකි වීම. **(ලකුණු 02)**

iii.
1. මාර්ගය - මහා මාර්ග/ මාතර - ගාල්ල මාර්ගය
2. මාධ්‍යය - බස් රථය
3. බලය - ඩීසල් / පෙට්‍රල්
4. පර්යන්තය - මාතර බස්නැවතුම්පොළ , ගාල්ල බස්නැවතුම්පොළ **(ලකුණු 02)**

iv. සැලසුම්කරණය - චාමර ව්‍යාපාරයට බඳවා ගැනීමට තීරණය කිරීම.

සංවිධානකරණය - රියදුරු සේවකයෙකු බඳවාගැනීම.

v. බස්රථ ක්ෂය ගිණුම (හර) 10 000
බස්රථ ක්ෂය වෙන් කිරීමේ ගිණුම (බැර) 10 000
(මාර්තු මාසයේ බස්රථ ක්ෂය ගිණුම්ගත කිරීම) **(ලකුණු 02)**

vi. මුදල් ගිණුම (රුපියල්)

| | | | |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම | 400 000 | බස්රථ ගිණුම | 1 000 000 |
| බැංකු ණය ගිණුම | 600 000 | ඉන්ධන | 40 000 |
| සේවක ආදායම් - මගීන්ගෙන් $\frac{1}{2}$ | 160 000 | අලුත්වැඩියා වියදම | 10 000 |
| චාරිකා වලින් | 46 000 | රියදුරු වැටුප් $\frac{1}{2}$ | 40 000 |
| | | වෙනත් වියදම් | 6 000 |
| | | 03/31 ප/ගෙ/ශේෂය | 110 000 ① |
| | 1 206 000 | | 1 206 000 |
| 04/01 ඉ/ගෙ/ශේෂය | 110 000 | | |

vii. (අ) ජංගම වත්කම් - මුදල් ශේෂය 110 000 හෝ මුදල් ගිණුමෙන් ලද අගය

(ආ) ජංගම වගකීම - උපචිත බස්රථ අලුත්වැඩියා වියදම් රු. 2 000
උපචිත රියදුරු වැටුප් රු. 5 000 **(ලකුණු 02)**

viii. ආදායම් ,

| | | | |
|---|---|---|---|
| බස්රථ ආදායම මගීන්ගෙන් | රු. 160 000 | $\frac{1}{2}$ | |
| චාරිකා වලින් | රු. 46 000 | | රු. 206 000 |

වියදම් ,

| | | | |
|---|---|---|---|
| ඉන්ධන | රු. 40 000 | $\frac{1}{2}$ | |
| අලුත්වැඩියා | රු. 12 000 | | |
| රියදුරු වැටුප් | රු. 45 000 | | |
| වෙනත් වියදම් | රු. 6 000 | $\frac{1}{2}$ | |
| බස්රථ ක්ෂය | රු. 10 000 | | |
| බැංකු ණය පොළී | රු. 2 000 | | රු. 115 000 |
| ශුද්ධ ලාභය | | | රු. 91 000 $\frac{1}{2}$ |

ix. ප්‍රාග්ධනය රු.400 000 $\frac{1}{2}$

ශුද්ධ ලාභය රු. 91 000 ①

රු.491 000 $\frac{1}{2}$

නැතහොත්,

රු. 491 000/= ②

x. මුළු වගකීම රු. 609 000/= ②

| | | |
|---|---|---|
| බැංකු ණය | රු.600 000 | ① |
| උපචිත බැංකු ණය පොළී | රු. 2 000 | |
| උපචිත අලුත්වැඩියා වියදම් | රු. 2 000 | ① |
| උපචිත රියදුරු වැටුප් | රු. 5 000 | |
| | රු.609 000 | |

**(මුළු ලකුණු 2 x 10 = 20)**

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

02. i. (අ) මිනිස් අවශ්‍යතා ඉටුකරන ඕනෑම කටයුත්තකි./ මිනිස් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය විවිධ වූ භාණ්ඩ හා සේවා නිපදවීම හෝ සැපයීම ආශ්‍රිත ආර්ථික කටයුත්තකි. **(ලකුණු 01)**

(ආ)
- අයිතිකරුවන්
- කළමනාකරුවන්
- ණයදෙනුකරුවන්
- සැපයුම්කරුවන්
- තරඟකරුවන්
- රජය
- ප්‍රජාව
- සේවකයන්

**(ලකුණු 01)**

ii. (අ) අසත්‍ය (ආ) සත්‍ය
(ඉ) සත්‍ය (ඊ) අසත්‍ය ($\frac{1}{2}$ x 4 = **ලකුණු** 02)

iii. (අ)
- විදේශීය ප්‍රාග්ධනය රට තුලට ඇදී ඒම.
- නවීන තාක්‍ෂණය ලබා ගත හැකි වීම.
- දේශීය භාණ්ඩ හා සේවා සඳහා විදේශීය වෙළෙඳපොළ ලබා ගත හැකි වීම.
- තත්ත්වයෙන් උසස් අමුද්‍රව්‍ය ලබා ගත හැකි වීම.
- අති නවීන යන්ත්‍ර සූත්‍ර ලබා ගත හැකි වීම. **(ලකුණු 01)**

(ආ) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය **(ලකුණු 01)**

iv. (අ)
- අයිතිය හා පාලනය රජය සතු වීම.
- අඛණ්ඩ පැවැත්ම.
- අරමුදල් රජය මඟින් සැපයීම.
- නීතිමය කටයුතු වලදී දෙපාර්තමේන්තු ප්‍රධානියා සිය නිල නාමයෙන් පෙනී සිටිය යුතු වීම.

**(ලකුණු 01)**

(ආ) ව්‍යාපාරයක් සතු සම්පත් සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මඟ පෙන්වීම හා පාලනය කිරීම තුළින් ව්‍යාපාරයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කිරීමේ ක්‍රියාවලිය කළමනාකරණය වේ.

**(ලකුණු 01)**
**(මුළු ලකුණු 08)**

03. i. (අ) වෙළෙඳාම පහසු කිරීම හා කාර්යක්‍ෂම කිරීම සඳහා සහයවන්නා වූ සේවා උපකාරක සේවා වේ./ ව්‍යාපාරයක් සාර්ථකව පවත්වාගෙන යාම සඳහා අවශ්‍යවන විවිධ සේවා උපකාරක සේවා වේ.

**(ලකුණු 01)**

(ආ)
- නැවත අලෙවි කිරීමේ චේතනාවෙන් භාණ්ඩ මිලදී ගැනීම.
- භාණ්ඩ විශාල ප්‍රමාණයක් එකවර අලෙවි කිරීම.
- භාණ්ඩ වර්ග කිහිපයක් පමණක් අලෙවි කිරීම.
- සාපේක්‍ෂව ඒකකයක විකුණුම් මිල අඩු වීම.
- වෙළෙඳ වට්ටම් ලබා දීම. **(ලකුණු 01)**

ii. (අ) සත්‍ය (ආ) සත්‍ය
(ඉ) අසත්‍ය (ඊ) සත්‍ය ($\frac{1}{2}$ x 4 = **ලකුණු** 02)

iii. (අ) චෙක්පතේ මුහුණතෙහි සඳහන් නම ඒ ආකාරයෙන්ම චෙක්පතේ පිටුපස ලිවීම. **(ලකුණු 01)**

(ආ)
- භාණ්ඩයේ ස්වභාවය
- ප්‍රවාහන පිරිවැය
- ධාරිතාව
- ආරක්‍ෂාව
- වේගය
- සුලබතාවය **(ලකුණු 01)**

iv. (අ) රු. 20 000.00 කි **(ලකුණු 01)**

(ආ)
- දත්ත විනාශ වීමේ අවදානමක් තිබීම.
- විද්‍යුත් වංචා වලට නතු වීමේ අවධානම.
- අමතර පිරිවැයක් දැරීමට සිදු වීම.
- ඇතැම් වෙළෙඳසැල් වලදී ගෙවීම් කිරීමට භාවිතා කළ නොහැකි වීම. **(ලකුණු 01)**

**(මුළු ලකුණු 08)**

04. i. (අ) රජයේ කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන කෙටි කාලීන සුරකුම්පත් විශේෂයකි. **(ලකුණු 01)**

(ආ)
- මිලදී ගත් කොටස් සඳහා ලාභාංශ ආදායම් ලැබිය හැකි වීම.
- ගත් මිලට වඩා වැඩි වටිනාකමකට විකිණීමෙන් ප්‍රාග්ධන ලාභ ලබා ගත හැකි වීම.
- ඕනෑම අවස්ථාවක සාමාන්‍ය කොටස් අලෙවි කර මුදල් ලබා ගැනීමට හැකි වීම.
- ණය ලබා ගැනීමේ දී ඇප සුරකුම්පත් ලෙස ඉදිරිපත් කළ හැකි වීම.
- ඡන්දය භාවිතා කර අධ්‍යක්‍ෂ මණ්ඩලයට එක් වීම මඟින් සමාගමට සම්බන්ධ තීරණ ගැනීමට දායක වීම. **(ලකුණු 01)**

ii. (අ) සත්‍ය (ආ) අසත්‍ය
(ඉ) සත්‍ය (ඊ) අසත්‍ය ($\frac{1}{2}$ x 4 = **ලකුණු** 02)

iii. (අ)
- විදුලි ගාස්තු සඳහා
- රක්ෂණ ගාස්තු සඳහා
- සේවක වැටුප් සඳහා
- සේදුම්කාරක මිලදී ගැනීම සඳහා **(ලකුණු 01)**

(ආ)
- ශ්වේතාගේ ප්‍රාග්ධනය
- ශ්වේතාගේ ණය මුදල **(ලකුණු 01)**

iv. (අ) A - ස්ථානය/ බෙදාහැරීම
B - නිෂ්පාදනය
C - ප්‍රවර්ධනය
D - මිල **(ලකුණු 01)**

(ආ)
- ගණුදෙනුකරුවන් ව්‍යාපාරයට ආකර්ෂණය කර ගැනීම
- වත්මන් ගණුදෙනුකරුවන් ව්‍යාපාරය සමඟ රඳවා ලබා ගැනීම. **(ලකුණු 01)**

**(මුළු ලකුණු 08)**

## II කොටස - ගිණුම්කරණය

05. i. (අ) වගකීමක් යනු අතීත ගණුදෙනුවක හෝ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ව්‍යාපාරය විසින් ගෙවිය යුතතු අගයයි. (ව්‍යාපාරයේ බැඳීම) **(ලකුණු 01)**

(ආ) වැඩි වීම - හර
අඩු වීම - බැර **(ලකුණු 01)**

ii. (අ) කසුන්ගේ ගිණුම - හර රු. 8 000
බැංකු ගිණුම - බැර රු. 8 000

(ආ) ගැනිලි ගිණුම - හර රු. 5 000
මුදල් පොත - බැර රු. 5 000 **(ලකුණු 02)**

iii.

| ගණුදෙනුව | වත්කම් (රු.) = | හිමිකම් (රු.) + | වගකීම් (රු.) |
|---|---|---|---|
| 1. | + 200 000 (මුදල්) | + 200 000 (ප්‍රාග්ධනය) | |
| 2. | + 100 000 (මුදල්) | | + 100 000 (බැංකු ණය) |
| 3. | - 60 000 (මුදල්)<br>+ 60 000 (කාර්යාල උප.) | | |
| 4. | - 1 000 (මුදල්) | - 10 000 (කුලී) | |
| 5. | + 15 000 (තොගය) | | + 150 000 (ණයහිමි) |

**($\frac{1}{2}$ x 4 = ලකුණු 02)**

(ආ) 1. ජංගම නොවන වත්කම්

කාර්යාල උපකරණ රු. 60 000 $\frac{1}{2}$

2. ජංගම වත්කම්

මුදල් රු. 230 000
තොගය රු. 150 000
රු. 380 000 $\frac{1}{2}$

3. හිමිකම් රු. 190 000

4. මුළු වගකීම්

බැංකු ණය රු. 100 000

ණයහිමියෝ රු. 150 000

රු. 250 000 $\frac{1}{2}$ **(ලකුණු 02)**

iv. (අ) ගැනුම් ජ'නලය

| දිනය | ඉ/අ | සැපයුම්කරු | මුළු වටිනාකම (රු.) | ලෙ.පි |
|---|---|---|---|---|
| 2020/01/10 | 510 | නිශාන් | 40 000 $\frac{1}{2}$ | |
| 2020/01/18 | 420 | අසංක | 6 000 $\frac{1}{2}$ | |
| 2020/01/31 | | ගැනුම් ගිණුමට මාරු කළා | 10 000 $\frac{1}{2}$ | |

(ආකෘතියට $\frac{1}{2}$ සමඟ ලකුණු 02)

(ආ) ගැනුම් ගිණුම

| දිනය | විස්තරය | ස/පි | වටිනාකම (රු.) | දිනය | විස්තරය | ස/පි | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|
| 2020/01/31 | ණයහිමි ගිණුම $\frac{1}{2}$ | | 10 000 | | | | |

නිශාන්ගේ ගිණුම

| දිනය | විස්තරය | ස/පි | වටිනාකම (රු.) | දිනය | විස්තරය | ස/පි | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2020/01/10 | ගැනුම් ගිණුම $\frac{1}{2}$ | | 4 000 |

අසංකගේ ගිණුම

| දිනය | විස්තරය | ස/පි | වටිනාකම (රු.) | දිනය | විස්තරය | ස/පි | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2020/01/18 | ගැනුම් ගිණුම $\frac{1}{2}$ | | 6 000 |

(ආකෘතියට $\frac{1}{2}$ සමඟ ලකුණු 02)

| I | II | III | IV | මුළු ලකුණු |
|---|---|---|---|---|
| 02 | 02 | 04 | 04 | 12 |

06. i. (අ) බැංකු අයිරාවක් යනු ජංගම ගිණුමේ ඇති ශේෂය ඉක්මවා නිකුත් කර ඇති චෙක්පත් වල වටිනාකම වේ. **(ලකුණු 01)**

(ආ)
1. මූලික සටහන් පොත්වල ගණුදෙනු සටහන් කිරීමේදී
2. මූලික සටහන් පොත්වලින් ලෙජරයට පිටපත් කිරීමේදී
3. ලෙජර ගිණුම් තුලනය කිරීමේදී
4. ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේදී

**(ඕනෑම 02 කට ලකුණු 02)**

ii. (අ) $\frac{\text{රු. } 80\ 000}{40}$ = මල් පෝච්චි ගණන 2 000 **(ලකුණු 01)**

(ආ)

| | | | |
|---|---|---|---|
| මුළු නිෂ්පාදන පිරිවැය | | = | රු. 80 000 |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | | = | රු. 30 000 |
| ප්‍රාථමික පිරිවැය | | = | රු. 50 000 |
| සෘජු ශ්‍රම පිරිවැය | රු. 12 000 | | |
| සෘජු වෙනත් | රු. 8 000 | | රු. 20 000 |
| සෘජු ද්‍රව්‍ය පිරිවැය | | = | රු. 30 000 |

**(ලකුණු 01)**

iii. (අ)

බැංකු ගිණුම (රුපියල්)

| | | | |
|---|---|---|---|
| ශේෂය $\frac{1}{2}$ | 28 000 | ස්ථාවර නියෝග | 2 500 $\frac{1}{2}$ |
| සෘජු ප්‍රේෂණ $\frac{1}{2}$ | 3 000 | ශේෂය ප/ගෙ | 28 500 $\frac{1}{2}$ |
| | 31 000 | | 31 000 |
| ශේෂය ඉ/ගෙ | 28 500 | | |

**(ලකුණු 02)**

(ආ)

2020 මාර්තු මාසය සඳහා
බැංකු සැසඳුම් විස්තරය

| | රු. | රු. |
|---|---|---|
| බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය $\frac{1}{2}$ | 28 500 | |
| <u>එකතු කළා</u> | | |
| නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් | 3 800 | 3 800 $\frac{1}{2}$ |
| | | 32 300 |
| <u>අඩු කළා</u> | | |
| තැන්පත් කළ නමුත් නිෂ්කාශණය නොවූ චෙක්පත් | 4 000 | 4 000 $\frac{1}{2}$ |
| 2020/01/30 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය | | 28 300 $\frac{1}{2}$ |

**(ලකුණු 02)**

iv.

| දිනය | ජ'නල් ව/අ | විස්තරය | හර (රු.) | බැර (රු.) | |
|---|---|---|---|---|---|
| | | ණයගැති ගිණුම - හර<br>විකුණුම් ගිණුම - බැර<br>(රු. 5 000 ක විකුණුම් ඉන්වොයිසිය මඟහැරීමේ වරද නිවැරදි කිරීම.) | 5 000 | 5 000 | ① |
| | | කාර්යාල උපකරණ ගිණුම - හර<br>ගැනුම් ගිණුම - බැර<br>(කාර්යාල උපකරණ රු. 20 000 ක මිලට ගැනීම ගැනුම් ගිණුමට හර කිරීමේ වරද නිවැරදි කිරීම.) | 20 000 | 20 000 | ① |
| | | අවිනිශ්චිත ගිණුම - හර<br>ණයගැති ගිණුම - බැර<br>(ණයගැතියෙකුගෙන් රු. 8 000 ක ලැබීම් මුදල් පොතේ පමණක් සටහන් කිරීමේ වරද නිවැරදි කිරීම.) | 8 000 | 8 000 | ① |
| | | අවිනිශ්චිත ගිණුම - හර<br>විකුණුම් ගිණුම - බැර<br>(විකුණුම් ජ'නලයේ එකතුව රු. 35 000 ක් විකුණුම් ගිණුමේ රු. 5 000 ක් ලෙස සටහන් කිරීමේ වරද නිවැරදි කිරීම.) | 30 000 | 30 000 | ① |

**එක් ජ'නල් සටහනකට ලකුණු 01 බැගින් (01 x 4 = ලකුණු 04)**

| I | II | III | IV | මුළු ලකුණු |
|---|---|---|---|---|
| 02 | 02 | 04 | 04 | 12 |

07. i. (අ) ලාභ හෝ අලාභ ප්‍රකාශනය
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය **(ලකුණු 01)**

(ආ) බොල් ණය ගිණුම - හර
ණයගැති ගිණුම - බැර **(ලකුණු 01)**

ii. රන්තරු ක්‍රීඩා සමාජයේ
2019/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

| | රු. | රු. |
|---|---|---|
| ආදායම් | | |
| සාමාජික මුදල් (150x100) | | 15 000 $\frac{1}{2}$ |
| අඩු කළා වියදම් | | |
| ක්‍රීඩා උපදේශක ගාස්තු | 6 000 | |
| ක්‍රීඩාගාර නඩත්තු වියදම් | 3 000 ① | |
| විදුලි ගාස්තු | 2 000 | 11 000 |
| අතිරික්තය | | 4 000 $\frac{1}{2}$ |

**(ලකුණු 02)**

iii. (අ) හංසනීගේ ව්‍යාපාරයේ
2019/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය

| | රු. | රු. | රු. |
|---|---|---|---|
| විකුණුම් | | | 340 000 |
| අඩුකළා විකුණුම් පිරිවැය | | | |
| 01/01 තොගය | | 25 000 | |
| ගැනුම් | | 250 000 | |
| විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩ පිරිවැය | | 275 000 | |
| අඩුකළා අවසන් තොගය | | $\frac{1}{2}$ (18 000) | 257 000 $\frac{1}{2}$ |
| දළ ලාභය | | | 83 000 $\frac{1}{2}$ |
| එකතු කළා වෙනත් ආදායම් - ලද වට්ටම් | | | 5 000 |
| | | | 88 000 |
| බෙදාහැරීමේ වියදම් - දුන් වට්ටම් | 2 000 | | |
| - ප්‍රචාරණය | 6 000 | 8 000 | |
| පරිපාලන වියදම් - විදුලිය | 3 800 $\frac{1}{2}$ | | |
| - යන්ත්‍ර ක්ෂය | 15 000 $\frac{1}{2}$ | | |
| - වරිපනම් | 1 200 | | |
| - වේතන | 10 000 | | |
| මූල්‍ය වියදම් | - | 30 000 | 38 000 |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කළා $\frac{1}{2}$ | | | 50 000 $\frac{1}{2}$ |

**(ලකුණු 04)**

(ආ)

හංසනීගේ ව්‍යාපාරයේ
2019/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය

| | පිරිවැය රු. | සමුච්චිත ක්ෂය රු. | ධාරණ අගය රු. |
|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | | | |
| ඉඩම් හා ගොඩනැගිලි | 500 000 | - | 500 000 |
| යන්ත්‍ර | 150 000 | 30 000 $\frac{1}{2}$ | 120 000 $\frac{1}{2}$ |
| | 650 000 | 30 000 | 620 000 |
| ජංගම වත්තම් | | | |
| 2019/12/31 තොගය | | 18 000 $\frac{1}{2}$ | |
| ණයගැතියෝ | | 20 000 | |
| බැංකු ශේෂය | | 10 000 | |
| මුදල් ශේෂය | | 8 000 | 56 000 |
| මුළු වත්කම් | | | 676 000 |
| ප්‍රාග්ධනය | | 600 000 $\frac{1}{2}$ | |
| එකතු කළා ශුද්ධ ලාභය | | 50 000 $\frac{1}{2}$ | 650 000 |
| ජංගම නොවන වත්කම් | | | |
| - | | | |
| ජංගම වත්කම් | | | |
| ණයහිමියෝ | | 25 000 | |
| ගෙවිය යුතු විදුලි ගාස්තු | | 1 000 $\frac{1}{2}$ | 26 000 |
| හිමිකම් හා වගකීම් | | | 676 000 |

**(ලකුණු 04)**


| I | II | III | | මුළු ලකුණු |
|---|---|---|---|---|
| | | (අ) | (ආ) | |
| 02 | 02 | 04 | 04 | 12 |


අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට


**www.lol.lk**
**Learn Ordinary Level**


LOL.lk online Book Store


අමතන්න - 071 777 4440/0756999990/071 8540371





































Online shopping

**www.lol.lk**
**Learn Ordinary Level**

DELIVERY ISLANDWIDE
SECURE PAYMENT

LOL.lk
online Book Store
071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්










## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්














## කෙටි සටහන් පොත්










වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්

ගෙදරටම ගෙන්ව ගන්න

ඔන්ලයින් ඔඩර් කරන්න

WWW.LOL.LK

වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal

NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers